# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1815/5 – 2013 ජුනි 17 වැනි සඳුදා – 2013.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/22/66/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

131 වන අධිකාරය

අංක 1798/63 දරන හා 2013.02.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් ගෝනවල, පමුණුවිල, අංක. 123/3හි පදිංචි සී. ටී. ජානක පුෂ්පකුමාර මහතා ඇතුළු පිරිස හා අනෙක් පාර්ශ්වය වශයෙන් මාකොළ, සපුගස්කන්ද, ලෙවින් ඩ්‍රයිව් හි පිහිටි ටෙලබර්ග් ලංකා (පුද්ගලික) සමාගම අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක ඒ 3409 දරන හා 2013.01.18 දිනැති ප්‍රදානය අවලංගු කරන ලෙසට ටෙලබර්ග් ලංකා (පුද්ගලික) සමාගම වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක ඒ 3409 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2014.02.22 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. චාන්දනී අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2013 ජුනි මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 017814 – 325 (2013/06)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## පළමුවන උපලේඛනය

### ''අ'' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)


### 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

### බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ලිපිනය: ටෙලබර්ග් ලංකා (පුද්ගලික) සමාගම,
ලෙවින් ඩ්‍රයිව්,
සපුගස්කන්ද, මාකොළ,
2013 මැයි මස 27 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2013.02.22 දිනැති අංක 1798/63 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, සී. ටී. ජානක පුෂ්පකුමාර මහතා ඇතුළු සේවක පිරිස, නො. 123/3, පමුණුවිල, ගෝනවල සහ ටෙලබර්ග් ලංකා (පුද්ගලික) සමාගම, ලෙවින් ඩ්‍රයිව්, සපුගස්කන්ද, මාකොළ බැඳී සිටින්නා වූ ද 2013.01.18 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙන ලැබේ.



ටෙලබර්ග් ලංකා (පුද්ගලික) සමාගම,

පිටපත: සී. ටී. ජානක පුෂ්පකුමාර මහතා ඇතුළු සේවක පිරිස,
අංක 123/3,
පමුණුවිල,
ගෝනවල.

07 - 19

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.